<u>බුදුසමයාගත ප්‍රතිභා සංකල්පය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්</u>

කීඹියේ අනුරුද්ධසිරි හිමි

පළමු වසර (විශේෂවේදී) කැලණිය විශ්වවිද්‍යාලය

anuruddhasiri1994@gmail.com

සාහිත්‍ය කලා සුබෝධනයෙහි ලා උපයුක්ත වන වැදගත් විචාර සංකල්පයක් ලෙස '**ප්‍රතිභාව**' හඳුන්වා දිය හැකි ය. ප්‍රාචීන-ප්‍රතිචීන සාහිත්‍ය විචාරකයෝ මෙම සංකල්පය පිළිබඳ විවිධ මත පළකොට ඇත්තාහ. පූර්වතන යුගයේ භාරතීය ආලංකාරිකයන් මෙන් ම ඇරිස්ටෝටල්, හොරස්, ලොන්ජයිනස් වැනි ග්‍රීක-රෝම විචාරකයින් ද සිය ලේඛනයන්හි ප්‍රතිභාව සම්බන්ධ කරුණු ගණනාවක් ම ඉදිරිපත් කොට ඇත. භාරතීය විචාරවාද හා අපරදිග විචාර චින්තාවන් ඔස්සේ ප්‍රතිභා සංකල්පය හඳුන්වාදීමට සියවස් ගණනකට පෙර බුදුන් වහන්සේ ද ඒ පිළිබඳ විවිධ තැන්හි දේශනා කළ බවට පාලි ත්‍රිපිටකය සාක්‍ෂ්‍ය සපයයි. බුදුසමයාගත ප්‍රතිභා සංකල්පයෙහි ස්වභාවයත් එහි පවතින සුවිශේෂත්වයත් විමර්ශනය කිරීම මෙම පරිසංවාදයේ මුඛ්‍යාභිලාසය යි.

මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් ඇසුරෙන් දත්ත රැස්කොට විශ්ලේෂණය කෙරෙන අතර ප්‍රතිභාව සම්බන්ධයෙන් ප්‍රාචීන හා ප්‍රතිචීන වියතුන් දැක්වූ අදහස් ද ඉදිරිපත් කරමින් තුලනාත්මක අධ්‍යයනයක් සිදුකිරීමට අපේක්‍ෂා කෙරේ. මෙහි දී බුදුසමයාගත ආකල්පය පාලි ත්‍රිපිටකය හා තදනුබද්ධ අට්ඨකථා ආශ්‍රයෙන් ඉදිරිපත් කරන අතර එහි පවතින සුවිශේෂත්වය; භාරතීය අලංකාර ශාස්ත්‍රය හා සම්බන්ධ ග්‍රන්ථයන්ගේත්, ඇරිස්ටෝටලියානු විග්‍රහයන්ගේත්, හොරස්ගේ ආස්පොයෙටිකා (Ars Poetica) හෙවත් '**සාහිත්‍යකරණ කලාව**' කෘතියේත්, ලොන්ජයිනස්ගේ 'On the Sublime' හෙවත් '**උත්කෘෂ්ටතාව අරභයා**' කෘතියේත් අන්තර්ගත ප්‍රතිභාව සම්බන්ධ මත සමග තුලනය කිරීමෙන් පෙන්වා දෙනු ලැබේ. එය තද් පර්යේෂණයේ සීමාව යි.

අංගුත්තරනිකායේ එතදග්ගවග්ගයෙහි එන වංගීස තෙරුන්ගේ තනතුරු නාමය හා සම්බන්ධ '**පටිභාන**' යන වචනයෙන් පැවසෙන්නේ විශිෂ්ට කවියෙකු තුළ පැවැතිය යුතු නෛසර්ගික ස්වභාවය යි. එයින් අදහස් කෙරෙන්නේ පෙර නො ඇසූවිරූ අදහස් අපූර්ව ලෙස ප්‍රකාශ කිරීමේ ශක්තිය කවියාට ඇති බව යි. එබඳු උසස් ගණයේ ප්‍රබන්ධ සිටිවනම ප්‍රකාශ කිරීමේ කෞශල්‍යය 'පටිභාන' ලක්‍ෂණයට ම අයත් වන බව '**ඨානසො**' යන පාලි පදයෙන් පැවසේ. මෙවැනි ප්‍රතිභාන්විත ප්‍රකාශනයන් බුදුරදුන්ගේ මුවින් ද ඇතැම් අවස්ථාවල පිටවූ බව සූත්‍රවල සඳහන් ව ඇත. ඒවා හඳුන්වා ඇත්තේ '**අනච්ඡරියගාථා**' යන නමිනි. 'පටිභානකවි' යන්නට විස්තර කථනයක් මනෝරථපූරණියෙහි දැක්වෙන අතර එහි එන "**තං ඛණංයෙව**" යන්න විශේෂ වේ. කාව්‍ය නිර්මාණය සඳහා වන්නා වූ ධී ශක්තිය ඒකක්‍ෂණික ව කවියා තුළ හටගන්නා බව එහි අදහසයි. පාලි ව්‍යාකරණඥයෝ "**පති සම්මුඛා භවන්ති ඤෙය්‍යා එතායාති පටිභා**" යන්නෙන් පූර්ව ජන්මයෙහි පුරුදු කළ බැවින් උපනිශ්‍රයාදි ප්‍රත්‍ය බලයෙන් එකෙණෙහි උපදනා ප්‍රඥාව ප්‍රතිභාව වන බව පවසති. දණ්ඩී කාව්‍යාදර්ශයේ "**නෛසර්ගකී ච ප්‍රතිභා**" යන්නෙන් දැක්වූයේ ද කාව්‍යකරණයෙහි පවතින නිසර්ගසිද්ධ භාවය යි.

අංගුත්තරනිකායේ චතුක්කනිපාතාගත කවිසූත්‍රයේ **චින්තාකවි, සුතකවි, අත්ථකවි, පටිභානකවි** යනුවෙන් කවීන් චතුර්විධ වන බව දක්වා ඇත. මෙය ලෝකයේ පැරණිතම කවීන් පිළිබඳ වර්ගීකරණය යි. වාමනාචාර්යවරයා කාව්‍යාලංකාරසූත්‍රවෘත්තියේ "**කවිත්වබීජං ප්‍රතිභානම්**" යනුවෙන් ප්‍රතිභාවට අර්ථකථනයක් ඉදිරිපත් කරයි. "ප්‍රතිභාව වනාහි කවිත්වයෙහි බීජය" බව ඉන් කියැවේ. දණ්ඩීන්ට අනුව ප්‍රතිභාවට වඩා කවිත්වය සඳහා හේතු වන්නේ ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසය යි. එහෙත් බුදුන් වහන්සේ පටිභාන කවියා වැඩි ඇගයුමට ලක්කිරීමෙන් පැහැදිලි වන්නේ කවිත්වය නමැති ඵලයට වඩාත් ම හේතු වන්නේ ප්‍රතිභාව බව යි, හෙවත් ප්‍රත්‍යෝත්පන්නය කවිත්වය බවත් ප්‍රබලතම ප්‍රත්‍යය ප්‍රතිභාව වන බවත් ය.

ධම්මචක්කපවත්තන සූත්‍රයේ එන **"පුබ්බෙ අනනුස්සුතෙසු"** යන්නෙහි අර්ථය පෙර නො ඇසූවිරූ යන්න යි. ආනන්ධවර්ධන ධ්වන්‍යාලෝකයේ දී **"අපූර්වවස්තුනිර්මාණක්ෂමා ප්‍රඥා ප්‍රතිභා"** යනුවෙන් දක්වන ලද්දේ ද ත්‍රිපිටකාගත 'පෙර නොවූවිරූ' අර්ථයට සමාන ව බව පෙනේ, යම් නිර්මාණයක් අපූර්ව වස්තුවක් වන්නේ එය පෙර නොවූ ආකාරයකින් ඉදිරිපත් වන්නේ නම් පමණි. භට්ටතෞත නම් විචාරකයා **"නවනවොන්මෙශශාලිනී ප්‍රඥා ප්‍රතිභා"** යන්නෙන් දැක්වූයේ ද මෙම අදහස යි. භාරතීය විචාරකයන්ටත් පෙර බුදුන් වහන්සේ ප්‍රතිභාපූර්ණත්වයෙහි අගය හඳුන්වා දුන් බව පදුමුත්තර බුදුන් ශ්‍රාවක භික්ෂුවකට ප්‍රතිභාවත් භික්ෂූන් අතර අගතනතුරක් පිරිනැමීම සම්බන්ධ වගීසත්ථෙරාපදානයේ දැක්වෙන ප්‍රවෘත්තියෙන් ද සනාථ වේ.

වංගීස තෙරුන්ට පැවත ඇත්තේ ප්‍රතිභා සම්පන්න ගාථා ගායනයෙහි සහජ හැකියාවකි. ක්‍රි.පූ. 3වන සියවසයේ ග්‍රීසියේ විසූ ඇරිස්ටෝටල්ගේ අදහස වූයේ කලාකරුවා දිව්‍යමය හේතුවේ (Divine reason) නැතහොත් විශ්වයේ අචල චාලකයාගේ (Immovable mover of the universe) මාධ්‍යය ලෙසින් ක්‍රියා කරන්නෙකු බව යි. එයින් පැහැදිලි වන්නේ කලාකරුවා යනු ස්වකීය නිර්මාණාත්මක ධී ශක්තියෙන් ආත්මීය ප්‍රකාශනයේ යෙදෙන්නෙකුට වඩා පාරභෞතික බලවේගයක ප්‍රකාශකයෙකු වන බව යි. මෙය එක් අතකින් ප්‍රතිභාව යන්න අධිස්වාභාවික (Supernatural) හෝ ගුප්තමය (Mysitical) ලෙස අවබෝධ කර ගැනීමකි. එක්තරා ආකාරයකට එය, ප්‍රතිභාව යනු පූර්ව ජන්මයන් නිසා ලද සහජ හැකියාවෙකැ'යි යන බුදුසමයාගත අදහසට සමීපතාවක් දක්වන බව පෙනේ. ක්‍රි.පූ. 65 හි රෝමයේ විසූ හොරස් නම් විචාරකයා ද සිය Ars Poetica කෘතියේ **"සහජ හැකියාවක් නොමැති ව නිර්මාණයක් කිරීමට උත්සාහ දැරීම ඵලදායක යැයි මම නො සිතමි"** යනුවෙන් පවසා ඇත. හෙතෙම දක්වන **සහජ හැකියාව** බුදුසමයාගත **පටිභා** යන්නට සමාන වේ. නමුත් ඇරිස්ටෝටල් හා හොරස් බුදුරදුන්ට පශ්චාත් කාලීන වීමෙන් ප්‍රකට වන්නේ බුදුසමයාගත ප්‍රතිභා සංකල්පය චිරන්තන වන බව යි.

සැබෑ කවියා කාව්‍යයක් ආකස්මිකව ම නිර්මාණය නො කරයි. චිරාත් කාලයක් ස්වකීය චේෂ්ටා පද්ධතියෙහි හැසිරෙමින් තිබූවක් තවදුරටත් දරාගත නොහී නිර්මාණාත්මක කලා කෘතියක වේශයෙන් පිටතට පමුණුවයි. '**උදාන**' යනු එබන්දකි. චිත්තෝද්ගත සෝමනස්ස ස්වභාවය හේතුවෙන් උදාන බිහිවන බැව් පරමත්ථදීපනියේ දැක්වේ. උත්කෘෂ්ට කාව්‍යයක් නිර්මාණය වන්නේ දිගුකාලීන අත්දැකීමක් මූලික වීමෙන් බවත්, කවියාගේ ප්‍රබල ප්‍රබෝධවත් ආවේග උද්දීපනයේ හැකියාව මත බවත්, ක්‍රි.ව. 1වන සියවසයේ රෝමයේ විසූ ලොන්ජයිනස් සිය On the Sublime කෘතියේ පවසා ඇත. මෙම මතය ත්‍රිපිටකයේ එන **උදාන** යන්නෙහි ලක්ෂණයන්ට සමාන වේ.

ප්‍රතිභාව පිළිබඳ බුදුසමයාගත ආකල්පය, ග්‍රීක රෝම සකු ආදි විචාර චින්තාවන්ගෙන් ප්‍රකාශිත ආකල්පයන්ට වඩා වෙනස් ස්වරූපයක් ගන්නා බව අපදානපාළියේ ගාථාද්වයකින් තහවුරු වේ.

"පටිභානවන්තං අග්ගං - සාවකං සාධුසම්මතං,
ගුණං බහුං පකිත්තෙත්වා - එතදග්ගෙ ඨපෙසි තං"
"එවමාදීහි සම්බුද්ධං - සන්ථවිත්වා මහාගුණං,
අවොචං වාදිසූරස්ස - ගතිං පප්පොමි භික්ඛුනො"

පූර්ව ගාථාවෙහි එන 'ප්‍රතිභා' යන පදයට සමාන ව දෙවන ගාථාවේ යොදා ඇත්තේ 'වාදීසූර' යන්න යි. අපදානපාළියෙහි එන මෙම කථා පුවතින් පැහැදිලිවම පෙනෙන්නේ ප්‍රතිභා ශබ්දයට 'වාදීසූර' යන්න සාම්‍ය ව ව්‍යවහාර වූ බව යි. ඉන් නිගමනය වන්නේ වාක්ශූර භාවය ප්‍රතිභාවේ මුඛ්‍ය ලක්ෂණයක් බව බුදුසමය පිළිගන්නා බව යි.

යථෝක්ත තුලනාත්මක විමර්ශනයෙන් බුදුසමයාගත ප්‍රතිභා සංකල්පය, ඒ පිළිබඳ ඉදිරිපත් වූ පෙර'පර දෙදිග අන්‍ය විග්‍රහයන්ට වඩා චිරන්තන වන බවත් නිසර්ගසිද්ධ ස්වභාවය, පෙර නො ඇසූවිරූ නො දුටුවිරූ යමක් විචිත්‍ර ලෙස ඉදිරිපත් කිරීම, වාග්ශූර ස්වභාවය, ඒකක්ෂණික වීම, මනසෙහි සෝමනස්ස ස්වභාවයෙහි ඉතිරී යෑම යන ලක්ෂණ එහි ලා උපයුක්ත වන බවත් නිගමනය වේ.

ප්‍රමුඛ පදඃ උදාන, ඨානසො, පටිභානකවි, පුබ්බෙ අනනුස්සුතෙසු, වාදීසූර